ආනන්දයේ ආදිශිෂ්‍ය, මධ්‍යම අංශයේ ප්‍රධානාචාර්යව සිටි,

★ කේ. ඩී. ද ලැනරෝල් මහතා විසිනි.

# මා දැනසිටි එල්. එච්. මෙත්තානන්ද

මා පළමුවරට මෙත්තානන්ද මහතා දක්කේ මීට අවුරුදු 49 කට පෙරදීය. එවකට මා ආනන්ද මහා විද්‍යාලයේ සත් වැනි පන්තියේ ශිෂ්‍යයෙක් වීමි. මෙත්තානන්ද මහතා අවුරුදු 24 ක් පමණවූ තරුණ ගුරුවරයෙක් විය. මේ තරුණ ගුරුවරයා සැරසී සිටියේ යුරෝපීය ඇඳුම් කට්ටලයකිනි. ඔහු කෝට් කලිසම් ඇන්දේ අනිත් ගුරුවරුන්ට වඩා ජැන්ඩියට ය. සුදු කලිසමකින් ද, ඔප වැටී දිලිසුණු පාවහන් අතරින් පෙනුණු විසිතුරු මේස් කුට්ටමකින් ද, යහමින් කැඳ වැටීමෙන් දැඩිවූ සුදු කොලරයක් වටා බැඳි ටයි පටියකින්ද කමිසය වැසෙන සේ ඇඳි බොත්තන් පෙළකින් සුසැදි ''වේස්ට් කෝට්'' නමැති වැස්මකින්ද ඒ මත ලූ කබායකින්ද සැරසුණු මෙත්තානන්ද මහතා ඇඳුමෙන් යුරෝපීයයකුටත් වඩා හැඩ වැඩවූ යුරෝපීයයෙක් විය,

විද්‍යාලාධිපති කුලරත්න මහතාගේ මුල්කාලයේදී එවකට නම් දැරූ සාන්ත තෝමස්, රෝයල්, වැස්ලි ආදී විද්‍යාලයයන්ගේ තත්වයට ආනන්දයත් නඟාලීම ගැන කොපමණ ලහියක් ඒ මහතා තුළ තිබුණාද කිවහොත් හොඳ ශිෂ්‍යයන් මෙන්ම හොඳ ගුරුවරුන් ගැන ද ආරංචි සොය සොයා ඔවුන් ආනන්දයට බඳවා ගත්තේ ය. එකල ආනන්දයෙහි ඉගැන්වූ සී. වී. රණවක, ටී. බී. ජයා, **ජෝර්ජ් වීරමන්ත්‍රී, ඩබ්ලිව්. ඒ. සමරවික්‍රම, විලියම් පෙරේරා, ජේ. ඇන්. ජිනේන්ද්‍රදස, ජේ. ඊ. ගුණසේකර, සිරිල් ස්ට්‍රෙන්ජ්, ඩබ්ලිව්. ඊ. ප්‍රනාන්දු, සී. ඊ. පී. කුමාරසිංහ, ජේ. ඇම්. ඒ. වික්‍රමනායක, වලිසිංහ ධර්මවංශ, ඩී. ඇම්. ද ඇස්. අබේනායක, වී. අයි. පෙරේරා, ඇස්. පී. පෙරේරා, වී. ටී. ඇස්. සිවගුරුනාදන්** වැනි විචක්ෂණ ගුරු තාරකාවන් අතර එල්. එච්. **මෙත්තානන්ද** ද දීප්තිමත්ව බැබළුණු තාරකාවක් විය. එවකට පුහුණු ඉංග්‍රීසි ගුරුවරයෙක් වූ මෙත්තානන්ද මහතා වැඩිකල් නොගොස් ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් බී. ඒ. උපාධිය ලබාගත්තේ ය. මෙත්තානන්ද මහතාට එකල පැවති අධ්‍යයන පාඨමාලාවට අනුව ඕනෑම පන්තියකට ඕනෑම විෂයයක් ඉගැන්වීමට හැකිකම තිබූ නමුත් ඔහු වැඩිපුර ඉගැන්වූයේ ඉග්‍රීසි හා ලතින් භාෂාවන් ය.

කලක් ගතවිය. මා ද දැන් ආනන්ද විද්‍යාලයේ උප ගුරුවරයෙකි. ගුරුගෝල සම්බන්ධයය නිසා ආධුනික ගුරුවරයාට සෙතක් වූ බව කිවමනා නොවේ. මෙකල වැඟි වහින්නාක් මෙන් නිදහස් විදේශ ශිෂ්‍යත්ව කඩා වැටෙන කාලයක් වුවත් එකල එබන්දක් නොවීය. මෙත්තානන්ද මහතාගේ සිත අධ්‍යාපනය කෙරෙහිම ඇදී ගිය බැවින් තව දුරටත් ඔහුගේ අධ්‍යාපනඥනය වර්ධනය කර ගැනීම් වස් සිය මැතිණියත් කැටුව එංගලන්තය බලා ගියේය. එහිදී ජීවිතය පිළිබඳ ඔහුගේ දර්ශනය සම්පූර්ණයෙන් වෙනස් විය. බටහිර සභ්‍යත්වයේ උසස් කොටස අත්හැර පිට ආටෝපය ආරූඪ කර ගත් සිංහලයා කෙරෙහි ඔහුගේ අනුකම්පාව යොමු විය. සියරටේ ජාතික ආගමටත් ජාතික භාෂාවටත් ජාතික සභ්‍යත්වයටත් වී ඇති විපතත් වන්නට යන භයානක ව්‍යසනයත් සක්සුදක්සේ දුටු ඔහු එංගලන්තයෙන් පිටත්ව ආවේ ලංකාවෙන් එහි ගිය මෙත්තානන්ද නොව ආධ්‍යාත්මික වශයෙනුත් බාහිර වශයෙනුත් වෙනස් වූ අමුතු මෙත්තානන්ද කෙනෙකි. බොම්බායට ගොඩ බට මෙත්තානන්ද මහතා එහිදී මහත්මා ගාන්ධිගේ ශ්‍රාවකයන් අඳින කදර් රෙද්දකින් ද. කදර් බැනියමකින් ද, කදර් උත්තර ශාටකයකින් ද සැරසිණි. ඔහුගේ ටයි කොලර් හා කබාය කලිසම් වලට වූ දේ මේතාක් අභිරහසක්ව පවතී. ඒවා ඉන්දීය සාගරයේ යම් තැනක මුහුදු පත්ලේ වුවත් විය හැක. මෙත්තානන්ද මහතා එද බොම්බාය පසු කළායින් පසුව කිසි දිනෙක කවර කාරණයක් නිසාවත් නැවත කලිසමට නො බැස්සේ ය. එවකට අනන්ද විද්‍යාලයේ උප විද්‍යාලයාධිපති ධුරය දැරූ මෙත්තානන්ද

මහතා පසුව ධර්මරාජ විද්‍යාලයේ විද්‍යාලයාධිපති ධුරයට පත්විය. ධර්මරාජයටත් ඔහුගෙන් මහත් සේවයක් සිදුවිය. කුලරත්න මහතා අවුරුදු 25 ක් ආනන්ද විද්‍යාලයාධිපතිව සිට සිය කැමැත්තෙන්ම විශ්‍රාම ගත් විගස මෙත්තානන්ද මහතා ආනන්දයට එන්නට කැමැත්ත දක්වූ නමුත් එය එලෙස සිදු නොවිය. එහෙත් නොබෝකලකින් විද්‍යාලයාධිපති ධුරය ලබා මහතුවරින් පැමිණි මෙත්තානන්ද මහතා වර්ෂ 1945 පටන් 1954 තෙක් ආනන්දයේ අධිපති ධුරය දැරිය.

මෙත්තානන්ද මහතා ආනන්දයේ විද්‍යාලයාධිපති වශයෙන් පත්වූයේ ආනන්දයට අභාග්‍යමත් කාලයක් උදවී තිබුණු අවධියකදී ය. නොමග ගිය ගුරුවරුන් කීප දෙනෙකුගේත් ඔවුන් විසින් පොළඹවනු ලැබූ ශිෂ්‍යයන් රැසකගේත් නොමනා ක්‍රියා කලාපය නිසා යුදබියෙන් මුළු ලෝකයමත් ලංකාවත් ගිනි ඇවිළී තිබුණු සමයක ආනන්දයත් ගිනිබත් විය. පාලකයන්ගෙන් කිසිම හවුහරණයක් නොමැතිව සාහසිකයන්ට නිර්භයව මුහුණ පෑ ගුරුවරුන් හා ශිෂ්‍යයන් කීපදෙනෙකුගේ උත්සාහය නිසා එද ආනන්දය විනාශ මුඛයෙන් ගලවා ගන්නට හැකිවිය. මෙත්තානන්ද මහතාට ආනන්ද භූමියට පිවිසීමට පොලිස් ත්‍රරකාවලක් ලැබුණ නමුත් කිසිම පොලිස් නිළධාරියකුට විද්‍යාලය තුළට නොපැමිණෙන ලෙස ඔහු අයැද සිටියේය. පන්ති වර්ජනය ගැන නොතකා වැඩෙහි යෙදෙමින් සිටි ගුරුවරුන් සවල්පදෙනෙකු හා සිසුන් දැක ඔවුන්ට සිය ප්‍රීතිය ප්‍රකාශ කොට එදින මෙත්තානන්ද මහතා පාසැල වටා ගියේ සේනාංකයක් පරීක්ෂා කරමින් යන සෙන්පතියෙකුගේ එඩිතර භාවයේ ප්‍රතිමූර්තිය මවා පාමිනි. අතරින් පතර කුඩා ගල් කැටයක්, කඩදාසි ගුලියක්, කටුක වචනයක් එතුමා වෙත එල්ල නුවූවායි කිය නොහැක. එහෙත් එදත් 'මෙත්තා' ආනන්දයට පිවිසියේ කවදත් ඔහු කෙරෙහි පැවති මෙත් සිතිනි. කිසිවකු කෙරෙහි ද්වේෂයෙන් නොවේ. ''වෛරම්බ වාතයක් හැමුවත් ආපසු නොයමි'' යන බෝධි සත්ව අධිෂ්ඨානයෙනි. අවංක පරමාර්ථයන් පෙරටු කොට මෙත් සිතින් ආරම්භ කරනු ලබන සත් ව්‍යාපාරයන් නොනැසී පවතී. ආනන්දය ඊට අසහාය නිදසුනයි. එම ආනන්දය ප්‍රතිෂ්ඨාපනය කිරීමෙහි ලා මෙත්තානන්ද මහතා එදින යම් අධිෂ්ඨානයක් කෙළේද එය සර්වප්‍රකාරයෙන් ම සාර්ථක විය. අඳුරුවළා පහවී ගොස් පායන හිරුගෙන් උණුසුම ලැබූ වන පෙතක් ප්‍රබෝධ වන්නාක් මෙන් ආනන්දය නැවතත් ප්‍රීතියෙන් උද්දම විය.

ගුරුවරුන්ගෙන් ශිෂ්‍යයන්ගෙන් සිත් දිනාගැනීමෙහි දක්ෂ වූ මෙත්තානන්ද මහතාට ඔහුගේ කාලය තුළදී අංග සියල්ලෙන් පරිපූර්ණ වූ විද්‍යාගාරයක් හා කලාත්මක ගොඩනැගිලි කීපයක්ම ඉදි කිරීමට හැකි විය. විද්‍යාලයේ කීර්ති රාවය නැවතත් රට පුරා පැතිර ගියේය. ඇම්. ඩබ්ලිව්. කරුණානන්ද මහතා ප්‍රමුඛ දක්ෂ විද්‍යා ගුරුවරුන්ගේ සහාය ඇතුව විද්‍යා අධ්‍යාපනය පිළිබඳ අලුත් වාර්තා පිහිටුවන්නට හැකිවිය. විරුද්ධතා මධ්‍යයේ ඔහු සිංහල භාෂාවට නිසිතැන ලබා දුනි. මෙත්තානන්ද මහතාගේ පෞරුෂත්වය මුලු විද්‍යාලයම ඉස්වහ ගියේය. බැලූ බැල්මට දක්ෂ ශිල්පියකු විසින් කළුගලෙන් නෙලන ලද ප්‍රතිමාවක රූ සෝබාව ගැබ්වූ ඔහුගේ මුහුණ විටෙක පියකරු සිනාවෙන් විකසිත වෙයි. වරෙක ඔහුගේ සිනාව ළපැටියකුගේ සිහිති සිනාව මෙන් අහිංසක ය. වරෙක ඔහුගේ සිනාව ඔහු තුළ පවතින ගැඹුරු සිතිවිල්ලක බාහිර නිමිත්ත ය. වරෙක ඔහුගේ සිනාව ගුප්ත ය, සාවඥ ය. ඕල්කොට් ශාලාව දිනපතා සිසුන් දහසකට මුහුණ දෙන ඔහුගේ දර්ශන මඩුල්ල ය. එය වාග් වාතුර්යය නමැති රැහැනින් සිසුන් හා ගුරුන් එකසේ අල්ලා බැඳ දමන ඔහුගේ ජයභූමිය ය. මෙත්තානන්ද මහතාගේ වාග් වාතුර්යයෙහි විශෙෂත්වයක්ද වෙයි. ඔහුගේ අභ්‍යන්තරයෙහි පහළ වන උද්වේග ඇතැම් විට ඔහුගේ මුඛයෙන් අඛණ්ඩව පිටවෙන වාග් මාලාව බිඳ හෙළයි. ''මාගේ හෘදය බුදු මැණියන්ගෙන් පිරී ඉතිරී යයි. මාගේ හෘදය බුදුපියාණන්ගේ ධර්මයෙන් පිරී ඉතිරී යයි'' මෙසේ කියමින් මඳ වේලාවක් කථා කිරීමට අසමත්ව ඔහු නවතී. ඔහුගේ දෙනෙතින් කඳුලු වැස්සෙයි. ශාලාව තුළ නිශ්ශබ්දතාවය පැතිර යයි. නැවතත් කථාව ඇරඹෙයි. වාම් ජීවිතය, සිංහල සිරිත් විරිත්, සිංහල වීරයෝ, මහත්මා ගාන්ධි, ඉන්දියානු වීරයෝ, බෝධිසත්ව චරිත, ආගමික කතාවත්, සමාජසේවය, බෞද්ධයන්ගේ දින තත්වය, සුද්දන්ගේ ගැට, මිශනාරින් කළ විනා, කළු සුද්දන්ගේ කුජපහි ගති යන ආදී විෂයයන් හා ඒවායේ දහසක් ප්‍රභේද ඔහුගේ දේශනවල මාතෘකාය. ඒවා අනගාරික ධර්මපාල තුමන්ගේ ''දැනගතයුතු කරුණු'' වලට සම කළ හැකි දේශන විය.

මේ අවදිය වන විට කලින් සඳහන්වූ පරිදි එංගලන්තයට ගොස් ආපසු පැමිණි මෙත්තානන්ද මහතාගේ ජීවිත පෙරළිය සිදුවී අවුරුදු විස්සක් පමණ ගතවී තිබුණි. මෙත්තානන්ද මහතාට තවත්

ඉවසුම් නැත. කාලීන බෝම්බයක් මෙන් මේතාක් සැහවී තිබුණාවූ ජාතියත් ආගමත් රටත් වෙනුවෙන ඔහු සාද තුබූ වැඩ සැලැස්ම දැන් ඉදිරිපත් කිරීමට කාලයයි. ඔහුගේම ගෝලයන්වූ විද්‍යාලයේ අංශ භාරව වැඩ කළ අප කීපදෙනෙකුට විද්‍යාලයේ සෑම වැඩක්ම භාරදී ඊට නැවත කිසිම ඇඟිලි ගැසීමක් නොමැතිව විද්‍යාලයාධිපති ධුරය දරමින් සිටියදීම බෞද්ධ බලවේග සටනේ මුළ පිරුවේ ය. ඉක්බිති එක් දුක්මුසු උදෑසනක ආනන්ද සිසුන්, ගුරුවරුන්, සේවකයන් කඳුළු වගුරවමින් සිටියදී මේ මහා පුරුෂයාණෝ සිඟිති දරුවකුසේ ළය කම්පාවෙන් ඉකිබිඳ හඬමින් සිය දයාබර ආනන්දයට ආයුබෝවන් කීහ.

මෙත්තානන්ද මහතා විසින් ඉන් පසුව රටටත් ජාතියටත් කරන ලද සේවය ගැන ලියා තැබීම සමකාලීන ඉතිහාසඥයින් අතින් මැනවින් ඉටුවනු ඇත. මා අදහස් කළේ ආනන්ද ශිෂ්‍යයයකු හා ගුරුවරයකු වශයෙන් මා දන සිටි මෙත්තානන්ද ගැන කෙටියෙන් යමක් ලිවීම පමණකි. ඉතා විශාරද වූත් බහුශ්‍රැත වූත් කාර්‍යක්‍ෂම වූත් විද්‍යාලයාධිපතිවරුන් ලැබීම ආනන්දයේ භාග්‍යය විය. එහෙත් එම විද්වතුන් අතරෙන් එක් කාරණයක් නිසා කැපී පෙනෙන විද්‍යාලයාධිපති වරුන් දෙදෙනෙක් වෙති. එනම් ශ්‍රීමත් ඩී. බී. ජයතිලක සහ එල්. එච්. මෙත්තානන්ද ය. ඒ මහා පුරුෂයන් දෙදෙනාම ආනන්දයේ විද්‍යාලයාධිපති වරුන් ලෙස අවිතීය සේවයක් කළ බව සැබෑ නමුත් ඒ උතුමානන්ගේ චරිතාපදානයේ ඉතා වැදගත් වූත් එලැඹි වූත් යුගය උදාවූයේ එම සේවයෙන් පසුව ය.

ආනන්දය නම් ප්‍රීතියයි. මෙත්තානන්ද නම් මෛත්‍රිය නිසා ඇතිවන ප්‍රීතියයි. එබැවින් සසර දුකින් මිදී නිවන් දකිනා තුරු මෙත්තානන්ද කෙරෙහි ආනන්දය වේවා!

---

"ලංකාවේ සමීපතර ඉතිහාසය බැබලවූ සෑම මානුෂික ධීරෝදාර ව්‍යාපාර ක්ෂේත්‍රයක ම විශිෂ්ඨතර වූ පුද්ගලයින් රැසක් ආනන්ද විද්‍යාලයයෙන් බිහිවිය"

— ආදිශිෂ්‍ය අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල